# සිංහල




## 3 ශ්‍රේණිය

Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education

## පාඩම - ළමා කවි නිර්මාණය කරමු.

**ක්‍රියාකාරකම 1**

- වැඩිහිටියෙකු ගේ උදවු ඇතිව පහත කවි පෙළ තාලයට ගායනා කරන්න.

**ක්‍රියාකාරකම 2**

### තරු කැට

ආකාසේ නිල් තරු කැට - පියාඹලා මහ පොළොවට
සේපාලිකා මල්ගහ උඩ - දිලිසෙනවා කදිම රුවට

මාල පොටක් පොඩි නංගිට - හදා දෙන්න පුළුවනි මට
නූල් පටක් අරන් අතට - හෙමින් ගියා ගහ ගාවට

සර සර ගා එක රෑනට - ඉගිල්ලුනා නිල් තරු කැට
කණාමැදිරියනි ආයෙත් - සමාවෙලා එන්න බිමට



අන්තර්ගතය : උතුරුමැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සැකසුම : ටී.ජ්.ම්.ජී දුලාන් සංජීව, නු/ගාමිණී මධ්‍ය මහා විද්‍යාලය, නුවරඑළිය

### ක්‍රියාකාරකම 3

- **කවි පෙළ ඇසුරෙන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

1. නිල් තරු කැට පියාඹලා ආවේ කොහේට ද?
   ......................................................
2. නංගිට සාදා දෙන්න ගියේ කුමක් ද?
   ......................................................
3. නිල් තරු කැට ඉගිල්ලුනේ ඇයි ?
   ......................................................
4. කවි පෙළේ කියවෙන සතාගේ නම කුමක් ද?
   ......................................................
5. රාත්‍රි කාලයට පිපෙන මල් වර්ගය කුමක් ද?
   ......................................................

### ක්‍රියාකාරකම 4

- තරු ගැන කවියක් නිර්මාණය කරන්න.

පහත අත්දැකීම් යොදාගත යුතු බව කතා කරන්න.

- රාත්‍රී අහසේ තරු පායා ඇත.
- තරු බබළන බව
- තරු පැයු අහස මල් වට්ටියක් වාගෙයි
- තරු නිවි නිවී දැල්වෙනවා සේ පෙනෙයි

............................................................................

............................................................................

............................................................................

............................................................................

............................................................................


අන්තර්ගතය : උතුරුමැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සැකසුම : ටී.ජී.ම්.ජී දුලාන් සංජීව, නු/ගාමිණී මධ්‍ය මහා විද්‍යාලය, නුවරඑළිය

# සිංහල

## 3 ශ්‍රේණිය

**ක්‍රියාකාරකම 5**

- කවි පන්තියේ ඔබ සිත්ගත් අවස්ථාවක් චිත්‍රයට නගන්න. පාට කරන්න.